# ඌව පළාත් සභාව 2021 වර්ෂය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඌව පළාත් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2022 දෙසැම්බර් 08 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 22 සැප්තැම්බර් 16 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ වාණිජ අත්තිකාරම් ගිණුම් 08 ක උපයන ලද එකතුව රු. 72,397,124 ක් වූ ලාභය පළාත් සභා මුදල් රීති 510.2 (ආ) ප්‍රකාරව වාණිජ අත්තිකාරම් ගිණුම්වලින් ලාභ අය ශීර්ෂය හෝ විවිධ ආදායම් අය ශීර්ෂය යටතේ පළාත් සභා ආදායමට බැර කර නොතිබුණි. | සියලුම ආදායම් මුදල් පදනම මත පමණක් ගිණුම්ගත කරනු ලැබේ. ඉදිරියේදී මෙම ආදායම් පළාත් සභා අරමුදල් ගිණුම් වලට ලැබීමෙන් අනතුරුව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | පළාත් සභා මුදල් රීති 510.2 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | වාණිජ අත්තිකාරම් ගිණුම් 08 කට අදාළව 2021 වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද රු. 20,863,181 ක් වූ ස්ථාවර වත්කම් ක්ෂය, පළාත් සභා මුදල් රීති 509.1 ප්‍රකාරව පළාත් භාණ්ඩාගාර ක්ෂය සංචිත අරමුදලට බැරකර නොතිබුණි. | ක්ෂය වෙන් කිරීම් ප්‍රේෂණය කරන ලද ආයතන වල මුදල් එම අරමුදලට බැර කර ඇති අතර අනෙකුත් ආයතන වල මුදල් ඉදිරි වර්ෂවලදී ලබාගැනීමට දන්වා යවා ඇත. | පළාත් සභා මුදල් රීති 509.1 අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1990 අංක 08 දරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තියේ X වන පරිච්ඡේදය ප්‍රකාරව අයකරනු ලබන මුද්දර ගාස්තු, ප්‍රාදේශීය සභා පනතේ 129 (2)(ආ), නගර සභා ආඥා පනතේ 158 (2)(ආ) සහ මහා නගර සභා ආඥා පනතේ 185 (2)(ඇ) හි සඳහන් විධිවිධාන ප්‍රකාරව අදාළ පළාත් පාලන ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලක් වෙත බැර විය යුතුය. ඒ අනුව, ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව රැස්කරනු ලබන මුද්දර ගාස්තු අදාළ පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය කරන තෙක් පළාත් සභා මූල්‍ය ප්‍රකාශන තුළ වගකීමක් වශයෙන් හඳුනාගත යුතු වුවත්, ඌව පළාත් සභා මූල්‍ය ප්‍රකාශන තුළ බදු ආදායම් යටතේ හඳුනාගෙන තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ ඒකාබද්ධ ආදායම් ගිණුමෙහි බදු ආදායම් යටතේ ඇතුළත් පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු මුද්දර ගාස්තු රු. 444,106,516 ක් විය. | 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අටවන උපලේඛනයේ 36:6 සහ 1990 අංක 08 දරණ ඌව පළාතේ මුදල් ප්‍රඥප්තියේ විධිවිධාන අනුව අය කරන මුද්දර ගාස්තු පළාත් සභා අරමුදලට බැර කරයි. 1993 අංක 05 දරණ ඌව පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තියේ 2 ඡේදය අනුව අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරී විසින් විෂය භාර අමාත්‍යවරයා වෙත වසර දෙකක් ඉක්මවීමට පෙර ලියවිල්ලකින් ඉල්ලීමක් ඉදිරිපත් කළ විටක පළාත් සභාව විසින් එකී මුද්දර ගාස්තුව පළාත් පාලන ආයතන වෙත ආපසු ගෙවිය හැක. මෙය නෛතික අසම්භාව්‍ය බැරකමක ස්වරූපයක් ගන්නා අතර වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් ඒ වෙනුවෙන් වැය විෂය අංක 1504 යටතේ ප්‍රතිපාදන සලසා ඇත. | පළාත් පාලන ආයතන වලට අය විය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු එම ආයතන වෙත ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ නොනිම් වැඩ එකතුව රු. 359,065,520 ක් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | එක් එක් ආයතන විසින් ගිණුම් තැබීම සඳහා ලබා දෙන තොරතුරු වල නොනිම් වැඩ වටිනාකම් ඉදිරිපත් කර නොමැත. | නොනිම් වැඩ වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | බීජ අර්තාපල් විශේෂ අත්තිකාරම් ගිණුමේ නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 10,379,495 ක් ඌව පළාත් සභා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල රු. 9,998,249 ක් ලෙස දැක්වීමෙන් රු. 381,246 ක වෙනසක් නිරීක්ෂණය විය. | පළාත් භාණ්ඩාගාරය වෙත ආරම්භයේ සිටම අයවිය යුතු ශේෂය සටහන් කර ඇත. බීජ අර්තාපල් විශේෂ අත්තිකාරම් ගිණුමේ වාර්තා කිරීමේ යම් වෙනසක් පවතී නම් එය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ශේෂය අත්තිකාරම් ගිණුමේ දැක්වෙන ශේෂයන් සමඟ එකඟ විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2021 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම්, අපහරණ, ආරම්භක හා අවසාන ශේෂ, එකිනෙක විසර්ජන ගිණුම්වල සඳහන් එකී ශේෂ සමඟ එකතුව රු. 1,403,860,519 කින් නොසැසඳුණි. | 2021 දෙසැම්බර් 31 දිනට පෙන්වා දී ඇති කේවල ගිණුම් වල වෙනස පාලන ගිණුමේ නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ශේෂය විසර්ජන ගිණුම්වල දැක්වෙන ශේෂයන් සමඟ එකඟ විය යුතුය. |
| (උ) | 2021 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ද ඇතුළුව, පළාත් සභාවේ ආයතන 05 කින් ලැබිය යුතු අග්‍රිම ශේෂය රු. 26,047,543 ක් විය. | 2022 වර්ෂයේදී නිරවුල් කරමින් පවතී. | ඌව පළාත් මුදල් රීති සංග්‍රහයේ මු.රී. 366.5.2 ප්‍රකාරව ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය නියම කරන දිනට පෙර පියවිය යුතුය. |
| (ඌ) | 2021 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව ලුහු ඉංජිනේරු හා පේෂකර්ම වාණිජ අත්තිකාරම් ගිණුම් වලින් පළාත් සභාවට අයවිය යුතු ශේෂය රු. 4,816,374 ක් වුව ද එම වාණිජ අත්තිකාරම් ගිණුම් අනුව පළාත් සභාව වෙත පියවිය යුතු ශේෂ දක්වා නොතිබුණි. | මෙම මුදල වාණිජ අත්තිකාරම් ගිණුම් වල සමුච්චිත අරමුදලින් ගෙවිය යුතු වගකීමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදී නැවත පියවා ගැනීමට කටයුතු කරමි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ශේෂය වාණිජ අත්තිකාරම් ගිණුම් වල ශේෂයන් සමඟ එකඟ විය යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා හා වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ඌව පළාත් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය අදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව පළාත් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන කළමනාකාරිත්වය සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනුලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරමි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය 700 - ආණ්ඩුකාර කාර්යාලය

අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2018 ඔක්තෝබර් 12 දිනැති "රාජ්‍ය වියදම් කළමනාකරණය" යන ශීර්ෂය යටතේ නිකුත් කළ අංක පීඑස්/සීඑස්ඒ/11-18 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයේ 4.1 ඡේදය | ආණ්ඩුකාරවර හා ආණ්ඩුකාරවර සම්බන්ධීකරණ ලේකම් වෙත මාසිකව උපරිම ඉන්ධන ප්‍රමාණයට අදාළ දීමනාවක් ලබාදී තිබියදී 2020 සැප්තැම්බර් මස සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා අතිරේක ඉන්ධන ලෙස පිළිවලින් ඉන්ධන ලීටර් 5,247.37 ක් වෙනුවෙන් රු. 909,322 ක් හා ඉන්ධන ලීටර් 3,420 ක් වෙනුවෙන් රු. 426,100 ක් ගෙවා තිබුණි. | පළාතෙන් පිටත රාජකාරී කටයුතු සඳහා ගරු ආණ්ඩුකාරතුමා සහභාගී වීමේදී අමතර ඉන්ධන බිල්පත් විශේෂත්වයක් සේ සලකා ප්‍රතිපූරණය කර ඇති අතර ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබාදුන් නියෝග ප්‍රකාරව සම්බන්ධීකරණ ලේකම්වරයා පළාතෙන් පිටත රාජකාරි ඉටු කිරීම සඳහා ඉදිරිපත් කළ ඉන්ධන බිල්පත් ප්‍රතිපූරණය කර ඇත. | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ඒ/11 -18 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

1.5.2 ශීර්ෂය 701 - සභා ලේකම් කාර්යාලය

(අ) අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (II) ඡේදය | සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් 30 දෙනෙකුට 2017 අගෝස්තු සිට 2022 ජූනි මාසය දක්වා මූලික වැටුපෙන් සියයට 25 ක් වන පරිදි රු. 13,222,231 ක විශේෂ දීමනා ගෙවා තිබුණි. | මෙම ගෙවීමට අදාළ නෛතික හා සාධාරණත්වය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට කමිටුවක් පත්කර ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිතය. | 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

(ආ) මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ඒ/11-18 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව පළාත් සභාවේ සභාපති ධූරය වෙනුවෙන් නිල රථ 02 ක් හා ආරක්ෂක රථයක් ලෙස වාහන 03 ක් හිමි වේ. 6 වන ඌව පළාත් සභාවේ නිල කාලය අවසන් වී සභාපති ධූරය නාමික තනතුරක් බවට පත්ව තිබියදී, 2019 ඔක්තෝබර් 08 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාල සීමාව වෙනුවෙන් පළාත් සභාවේ සභාපතිවරයා වෙත නිල රථ 02 ක් හා ආරක්ෂක රථයක් සඳහා රු. 12,960,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. | 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 7(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාවේ සභාපතිවරයාගේ ධූරය අවසන් නොවන අතර සභාපතිවරයා වෙත හිමි වරප්‍රසාද අඩු කිරීමටද නීතිමය ප්‍රතිපාදනයක් නොමැත. | ප්‍රවාහන දීමනාවක් ගෙවීම සඳහා චක්‍රලේඛය අනුව ප්‍රතිපාදන සලසා නොමැති බැවින් ගෙවන ලද මුදල් අය කර ගත යුතුය. |

(ඇ) අවිධිමත් ගනුදෙනු

| | | | |
|---|---|---|---|
| (i) | 6 වන ඌව පළාත් සභාවේ සිටි පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 187 දෙනෙකුට ඔවුන්ගේ සේවය 2019 ඔක්තෝබර් මාසයේදී අවසන් වීම වෙනුවෙන් ගෙවනු ලබන අවසාන ගෙවීමක් ලෙස දක්වා, එම නිලධාරීන්ට ගෙවන ලද මාසික දීමනාවෙන් සියයට 12 ක් වන පරිදි හා ඔවුන් සේවය කළ මාස ගණන අනුව සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 8,867,895 ක් වූ පාරිතෝෂික දීමනා ගෙවා තිබුණි. මෙම ගෙවීම සඳහා කිසිදු නෛතික විධිවිධානයක් නොපැවතුනි. | 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතේ සේවා යෝජකයකු වශයෙන් රජයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ අදාළ කර ගත නොහැකිය. රජයේ ව්‍යවස්ථාපිත ආයතන හා සංස්ථා වෙනුවෙන් මෙම පනත ක්‍රියාත්මක වන අතර මෙම ගෙවීම් එම පනතේ විධිවිධාන අනුව සිදුව නොමැත. | අවිධිමත්ව ගෙවන ලද දීමනා ආපසු අයකර ගත යුතුය. |
| (ii) | 6 වන ඌව පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසුව නාමික ධූරයක් වූ සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 11 දෙනෙකු වෙනුවෙන් 2019 ඔක්තෝබර් 08 දින සිට 2021 දෙසම්බර් 31 දින දක්වා ඌව පළාත් සභාවට කිසිදු සේවයක් ලබා ගැනීමෙන් තොරව රු. 14,034,374 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 7(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාවේ සභාපතිවරයාගේ ධූරය අවසන් නොවන අතර සභාපතිවරයා වෙත හිමි වරප්‍රසාද අඩු කිරීමටද නීතිමය ප්‍රතිපාදනයක් නොමැත. | සභාපතිවරයාගේ පෞද්ගලික කාර්යමණ්ඩලය සඳහා ගෙවීම් කිරීමට නෛතික ප්‍රතිපාදන සලසා නොමැති බැවින් ගෙවන ලද මුදල් නැවත අය කර ගත යුතුය. |

1.5.3 ශීර්ෂය 704 - ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය

(අ) අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ඌව පළාත් සභා මුදල් රීති 215.3.1 | ඌව ප්‍රජා ගුවන්විදුලියට උපකරණ මිලදී ගැනීම සඳහා 2021 දෙසැම්බර් 31 දින රු. 2,486,500 ක් පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණු නමුත් 2022 මැයි 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුනි. | පළාත් භාණ්ඩාගාරයට පසු අනුමැතිය සඳහා යොමුකර ඇත. | ඌව පළාත් මුදල් රීති සංග්‍රහයේ මු.රී. 215.3 අනුව ආසන්න ගෙවීම් සඳහා ප්‍රතිපාදන පවරාගෙන සංචිතයෙහි තබා ගැනීම නොකළ යුතුය. |

(ආ) ඌව ප්‍රජා ගුවන්විදුලිය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික වැටුප් කොමිෂන් සභාවේ ලේකම් විසින් 2022 මාර්තු 07 දින අංක NSCC/10/79/GE/AL දරන ලිපිය මගින් විගණකාධිපති වෙත තහවුරු කර ඇති පරිදි පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ වැටුප් හා දීමනා තීරණය කිරීමේ සෘජු බලතල ආණ්ඩුකාරවරුන් වෙත ලබාදී නොමැත. එසේ වුවද ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත ඌව ප්‍රජා ගුවන්විදුලියේ වැඩසටහන් නිෂ්පාදක වරුන් හා වැඩසටහන් රැගෙන එන නිලධාරීන් සඳහා සියයට 5, සියයට 10 හා සියයට 15 ප්‍රතිශත වලින් එකතුව රු. 1,035,225 ක් වූ කොමිස් මුදලක් 2021 වර්ෂයට අදාළ දිරි දීමනා වශයෙන් ගෙවා තිබුණි. | අමාත්‍ය මණ්ඩලය වෙත බලතල පැවරී තිබුණු කාල සීමාවේදී ගනු ලැබූ තීරණයක් මත මෙම දිරි දීමනාව ගෙවා ඇත. ජාතික වැටුප් කොමිෂන් සභාවේ ලේකම්ගේ ලිපිය අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අනුමැතියකින් තොරව ගෙවා ඇති කොමිස් මුදල් ආපසු අයකර ගත යුතුය. |

1.5.4 ශීර්ෂය 706 - කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු අමාත්‍යාංශය

කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 20 කට අධික කාලයක සිට පළාත් සහා මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් දැක්වෙන, බීජ අර්තාපල් විශේෂ අත්තිකාරම් ගිණුමේ හර ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 10,379,495 ක් වූ අතර මෙම ශේෂය ණය පදනම මත බීජ අර්තාපල් ලබාගත් නිලධාරීන් 398 දෙනෙකුගෙන් මාසිකව අයකර ගත යුතුය. එම ණය ක්‍රමාණුකූලව අයකර නොතිබුණ බව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 21 දෙනෙකුගෙන් රු. 323,850 ක් පමණක් අයකර ගැනීමෙන් තහවුරු විය. | මෙම ණය ශේෂය අය වෙමින් පවතින අතර ණය අයකර ගැනීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | ණය ශේෂය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2002 වර්ෂයේ මහ කන්නයේදී වගාකිරීම සඳහා බීජ අල ආනයනය කර ගොවීන් වෙත අලෙවි කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වැඩසටහන පිළිබඳව නොසැලකිල්ල හා සැලසුම් රහිත ක්‍රියාකාරකම් හේතුවෙන් පළාත් සහා අරමුදලට දැරීමට සිදු වී තිබුණු රු. 29,800,401 ක අලාභය අදාළ කාලපරිච්ඡේදය තුළ ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර වර්ෂ 20 කට පසුව පරිපූරක ඇස්තමේන්තුවක් මගින් ප්‍රතිපාදන සලසාගෙන සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබුණි. | 2002 වර්ෂයේ බීජ අර්තාපල් ආනයනයේදී සිදු වී ඇති රු.මි 29.8 ක ප්‍රාග්ධන අලාභයට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියා මාර්ග ගෙන, විනය කටයුතු වලින් එම නිලධාරීන් නිදහස් වී විශ්‍රාම ගොස් ඇත.<br><br>මෙම මුදල තුළ ඇතුළත් බීජ අල ආනයනය කරන ලද සමාගමෙන් ලබා ගත යුතු රක්ෂණයෙන් ආවරණය නොවූ රු.මි. 4.89 ක මුදල අයකර ගැනීම ඵල රහිත වන බව නීතිපති දෙපාර්තමේන්තුව දන්වා ඇත. ඒ අනුව එම අලාභය හා අය නොවූ මුදල ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත කපා හැර ඇත. | වගකිව යුතු නිලධාරීන්ගෙන් අලාභය අයකර ගත යුතුය. |

1.5.5 ශීර්ෂය 710 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින වැලිමඩ, දියතලාව, මහියංගනය යන මූලික රෝහල් සහ බණ්ඩාරවෙල හා පස්සර දිස්ත්‍රික් රෝහල් වල, 2021 දෙසැම්බර් 31 දිනට රු. 20,465,781 ක් වටිනා ඖෂධ තොග කල් ඉකුත් වී තිබුණු අතර රු. 4,648,532 ක් වටිනා ඖෂධ තොග තත්ත්වයෙන් අසමත් වූ ඖෂධ ලෙස හඳුනාගෙන භාවිතයෙන් ඉවත් කර තිබුණි. | 2018, 2019, 2020 හා 2021 වර්ෂ වලට අයත් කල් ඉකුත් වී ඇති ඖෂධ තොග වේ. කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් බාහිර රෝගී අංශය, සායන, වාට්ටු වල රෝගීන් සියයට 45 සිට සියයට 70 දක්වා අඩු වීම, වාර්ෂිකව ඇස්තමේන්තු කරන ලද ඖෂධ තොග සියල්ල කොළඹ වෛද්‍ය සැපයුම් අංශය මගින් ලබා දීම හා කෙටි කාලයකින් කල් ඉකුත් වන සමහර ඖෂධ තොග විශාල ප්‍රමාණයක් ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයට ලැබීම මේ තත්වයට හේතු වී ඇත. | ඖෂධ තොග ඇණවුම් කිරීම හා නිකුත් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ii) | මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් බිබිල මූලික රෝහලේ බාහිර රෝගී අංශය ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. 1,556,187 ක් වටිනා වර්ග 5 කට අයත් පරිගණක සහ වෙනත් උපකරණ ඒකක 52 ක් සහ වටිනාකම ඉදිරිපත් නොකෙරුණු මුද්‍රණ යන්ත්‍ර 04 ක් 2019 සහ 2020 වර්ෂ වලදී රෝහල වෙත ලබා දී තිබුණ ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම උපකරණ වසරකට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතිය සක්‍රීය කර ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය තොරතුරු ඒකකයේ තාක්ෂණික සහය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (iii) | මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සියඹලාණ්ඩුව මූලික රෝහලේ බාහිර රෝගී අංශය ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. 1,617,875 ක් වටිනා වර්ග 05 කට අයත් පරිගණක සහ උපකරණ ඒකක 53 ක් 2019 වර්ෂයේදී රෝහල වෙත ලබා දී තිබුණ ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම උපකරණ වසර 02 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතියේ කටයුතු වලින් සියයට 90 ක පමණ ප්‍රමාණයක් අවසන්ව ඇති බැවින් ඉදිරි මාස දෙක තුළ ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |

(ආ) පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

| | | |
|---|---|---|
| බිබිල මූලික රෝහලේ ගලි වලවල් පරිසරයට විවෘතව උතුරා යාමෙන් පිටවන අපද්‍රව්‍ය සහ රෝහලෙන් බැහැර කරන අපද්‍රව්‍ය මිශ්‍ර ජලය හා විෂ රසායනික ප්‍රතිචක්‍රීකරණයකින් තොරව රෝහල් කාණු පද්ධතිය හරහා පරිසරයට මුදා හරිමින් පැවතුණි. | රෝහලේ මල අපවහන පද්ධතිය හා ජල අපවහන පද්ධතිය ඉදි කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය මගින් රු. මිලියන 90 ක් වෙන් කර ඇත. | අපජලය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |

1.5.6 ශීර්ෂය 711 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(අ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2016 සැප්තැම්බර් 19 දින රු. 24,932,510 ක වටිනාකමකට ගිවිසුම් ගතව තිබුණු හාලිඇල දෙමළ මාධ්‍ය දෙමහල් ගුරු පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ කර්මාන්තය, 2017 සැප්තැම්බර් 18 දින වැඩ නිම කළ යුතු වුවද 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුම කඩකිරීම සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් කොටස් බිල්පත් ගෙවීමේදී කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගත හැකිව තිබුණු රු. 1,246,625 ක් වූ ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට නොහැකිවී තිබුණි. ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) විසින් ගිවිසුම අවලංගු කිරීමට නිර්දේශ කර තිබියදීත් ඒ අනුව කටයුතු නොකිරීමෙන් ඉතිරි වැඩ නිමකර ගැනීම සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු යොදා ගැනීමට ද නොහැකි වී තිබුණි.<br><br>වසර 05 කට අධික කාලයක සිට දෙමළ මාධ්‍ය ගුරු පුහුණු කටයුතු අඩාල වී තිබුණු අතර මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශ මගින් ලබාදී තිබුණු රු. 673,000 ක් වටිනා දේශනශාලා පුටු 150 ක් භාවිතයට නොගෙනම විනාශ වී තිබුණි. පරිගණක යන්ත්‍ර, ලැප්ටොප් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මල්ටිමීඩියා යන්ත්‍ර හා ලී බඩු උපකරණ රැසක් ප්‍රයෝජනයට නොගෙන අනාරක්ෂිතව පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ඉදිකිරීම් කඩිනමින් නිම කර උපයෝජනයට පියවර ගත යුතුය. |

(ආ) වත්කම් කළමනාකරණය

-----------------------------

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

| | | |
|---|---|---|
| 6-11 ශ්‍රේණිවල සිසුන්ට ඩිජිටල් තාක්ෂණය ආධාරයෙන් ඉගැන්වීමේ කටයුතු සඳහා යොදාගැනීම වෙනුවෙන් මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේදී පාසල් 07 ක් සඳහා ලබාදී තිබුණු ටැබ්ලට් පරිගණක 605 ක්, අන්තර්ජාල පහසුකම් ලබානොදීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අන්තර්ජාල පහසුකම් ලබාගෙන ටැබ්ලට් පරිගණක භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.7 ශීර්ෂය 712 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

----------------------------------------------------

පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය

-------------------------------------------

(අ) හිඟ ආදායම්

--------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාලෝචිත හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතන විසින් අයකර ගත යුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් රු. 569,098,265 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ආ) නිකුත් කර තිබුණු අධිභාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්

------------------------------------------------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාතේ පළාත් පාලන බල මණ්ඩලවල නිලධාරීන්ට හා නියෝජිතයින්ට පනවා තිබුණු අධිභාර වෙනුවෙන් රු. 5,724,219 ක් අය විය යුතුව තිබුණි. | පළාත් පාලන බල මණ්ඩලවල නිලධාරීන්ට හා නියෝජිතයින්ට පනවා තිබුණු අධිභාර අය වෙමින් පවතී. | අධිභාර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.8 ශීර්ෂය 714 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය විසින් බිම්මල් වගා ගෘහ ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ වගා ගෘහ ඉදිකිරීම සඳහා ප්‍රතිලාභීන් වෙත රු. 50,000 ක ආධාර මුදලක් අදියර 02 ක් යටතේ නිකුත් කිරීමට නියමිතව තිබුණි. පළමු අදියර යටතේ ආධාර මුදල් ලබාදුන් බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක ප්‍රතිලාභීන් 17 දෙනෙකු ගිවිසුමේ සඳහන් කරුණු හා පිරිවිතර වලට අනුකූලව අදාළ බිම්මල් ගෘහය සකස් කර නොතිබීම හේතුවෙන් දෙවන වාරික මුදල ගෙවීම තාවකාලිකව අත්හිටුවා තිබුණු අතර ගෙවීම් අත්හිටුවීම හේතුවෙන් රු. 340,000 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. ඒ අනුව එම ප්‍රතිලාභීන්ට ගෙවන ලද එකතුව රු. 510,000 ක් වූ පළමු වාරික මුදල් අනාර්ථික වියදමක් වී තිබුණි. | ප්‍රතිලාභීන්ගෙන් කොටසක් බිම්මල් ගෘහයේ කටයුතු සම්පූර්ණ නොකිරීම නිසා දෙවන අදියරේ මුදල් ලබා නොදෙන ලදී. ක්ෂේත්‍ර නිලධාරීන්ගේ අධීක්ෂණය සිදු කරමින් ඉතිරි ප්‍රතිලාභීන් දිරි ගන්වමින් ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතව ඇත. | පිරිවිතර වලට අනුකූලව බිම්මල් ගෘහ කඩිනමින් ඉදිකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | උමාඔය වගා හානි වෙනුවෙන් ගොවීන් වෙත වන්දි ගෙවීමේ ක්‍රියාවලියේදී වන්දි මුදල් අයදුම් කළ දිනයේ සිට අනුමත කිරීම දක්වා බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය විසින් දීර්ඝ කාලයක් ගත කිරීම නිසා 2019 පෙබරවාරි 26 දින සිට 2021 ඔක්තෝබර් 26 දින දක්වා ගොවීන්ට ගෙවිය යුතු වන්දි මුදල් රු. 8,691,620 ක් 2021 දෙසැම්බර් 31 දින දක්වාම පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | උමා ඔය වගා වන්දි ගෙවීම සඳහා සංශෝධනය කරන ලද ක්‍රමවේදයට 2020 නොවැම්බර් 17 දින අනුමැතිය ලැබුණු අතර අයදුම්පත් 4046 ක් සඳහා වන්දි ගෙවා ඇත. අයදුම්පත් 166 ක් අනුමැතිය සඳහා මහවැලි අමාත්‍යාංශයට ඉදිරිපත් ඉදිරිපත් කර ඇත. ගැටළු සහිත වූ අයදුම්පත් 15 ක් සඳහා කමිටුව ලබා දෙනු ලබන තීරණ ප්‍රකාරව ඉදිරියේදී ගෙවීමට කටයුතු කරනු ඇත. | අදාළ වන්දි මුදල් කඩිනමින් ගොවීන් වෙත නිදහස් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිදුවී තිබුණු වැටුප් මුදල් අතුරුදහන් වීමේ වංචාව සඳහා වර්ෂ 10 කට අධික කාලයක් ගතවී ඇති අතර 2021 දෙසැම්බර් 31 දිනට එයින් නිරවුල් නොවූ රු. 440,990 ක් ඌව පළාත් සහා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නීතිමය කටයුතු අවසන් වී ඇති බවට වාර්තා වී නොමැති හෙයින් මෙම ශේෂය තව දුරටත් පවතී. | නිරවුල් නොවූ ශේෂය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. |

1.5.9 ශීර්ෂය 716 - ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාණිජ පදනමින් ලබාදී තිබුණු දීර්ඝකාලීන බදු බලපත්‍ර 88 ක් බදුකරුවන් 87 දෙනෙකුට ලබාදී තිබුණු අතර එකී බදුකරුවන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 75,776,346 ක හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021 ඔක්තෝබර් 13 දිනැති අංක 2021/06 දරන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021/06 හා 2021 ඔක්තෝබර් 13 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව හිඟ බදු නොගෙවන බදුකර අවලංගු කර නීතිමය කටයුතු සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත. | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021 ඔක්තෝබර් 13 දිනැති අංක 2021/06 දරන චක්‍රලේඛයේ 02 ඡේදය හා බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

1.5.10 ශීර්ෂය 717 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | | |
|---|---|---|
| මැදගොඩ ගලමොටආර මහකුඹුර සුළු වාරිමාර්ග ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය රු. 1,226,740 ක වියදමින් 2021 අගෝස්තු 11 දිනට ප්‍රථම නිම කිරීම සඳහා ඌව මාවෙලගම පුබුදු ගොවි සංවිධානය සමඟ 2021 මැයි 11 දින ගිවිසුම් ගත වී 2021 දෙසැම්බර් 31 දින වන විට මාස 07 ක් ඉක්මවා තිබුණ ද කොන්ත්‍රාත්කරු විසින් අදාළ කර්මාන්තය ආරම්භ කර හෝ නොතිබුණි. | සිමෙන්ති මිල ඉහළ යාම හා සිමෙන්ති හිඟය හේතුවෙන් කර්මාන්තය ආරම්භ කිරීම සඳහා ගොවි සංවිධානය කටයුතු නොකළ අතර කිසිදු ගෙවීමක් ද කර නොමැත. | කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

1.5.11 ශීර්ෂය 726 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය

(අ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාසල්වල හදිසි ආපදා කළමනාකරණය වෙනුවෙන් ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණු ප්‍රතිපාදනයනයෙන් රු. 2,257,872 ක් වැය කර වැලිමඩ විජය විදුහලේ ඉදිකළ මීටර් 05 ක උසකින් සහ මීටර් 12 ක දිගකින් යුත් රැඳවුම් බැම්මේ ඉහළ කෙළවරින් වැලිමඩ බදුල්ල මාර්ගය දෙසට මිලිමීටර් 100 පමණ නෙරා තිබීම නිසා අනතුරුදායක තත්ත්වයක් පැවතුනි. | රැඳවුම් බැම්මට ඉහළින් වූ මිදුල ජලය කාන්දු නොවන පරිදි සකස් කළ අතර රැඳවුම් බැම්මෙහි ඉදිරියට නෙරා ඇති කොටස නැවත ඉදිකිරීමට කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇත. | අනතුරුදායක තත්ත්වය අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

(ආ) ප්‍රසම්පාදනය
--------------

| | | |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 ප්‍රකාරව ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්ගේ පැමිණීමේ ලේඛනයක් පවත්වා නොගැනීම හේතුවෙන් සාමාජිකයින්ගේ සහභාගීත්වය තහවුරු කර නොගෙන, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු දීමනා ලෙස රු. 1,225,780 ක් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන කාර්යයෙහි වගකීම සහ කාලය සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන කමිටු පවත්වා ඇති අතර කාර්යාලයේ පැමිණීම සටහන් කර තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් හෝ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පැවැත්වීමේ අවශ්‍යතාවයක් නොපවතී. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 ප්‍රකාරව පැමිණීමේ ලේඛන පවත්වා ගත යුතුය. |

(ඇ) පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය සඳහා වූ අත්තිකාරම් ගිණුම
-----------------------------------------------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා සේවාවන් සැපයීම වෙනුවෙන් අයවිය යුතු ණයගැති ශේෂය රු. 49,602,508 ක් වූ අතර 2022 ජුනි 24 දින වන විට එම ශේෂය රු. 32,966,924 ක් වීමෙන් ණය ගැති ශේෂ අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉකුත් වර්ෂ වලට අදාළ ණය ගැති ශේෂ අයකර ගැනීම සඳහා කමිටුවක් පත්කර ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. | හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.12 ශීර්ෂය 737 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය
--------------------------------------------------------------------------

අවිධිමත් ගනුදෙනු
---------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 උපමාන පාදක ආයෝජන වැඩසටහන යටතේ මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) වෙත ඉදිරිපත් කළ ව්‍යාජ බිල් පතක් පදනම් කර ගනිමින් 2021 දෙසැම්බර් 31 දින රු. 995,456 ක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවා තිබුණි. 2022 ජනවාරි 19 දින වන විටත් ප්‍රවේශ මාර්ගය මීටර් 200 ක් පමණ එළිපෙහෙළි කිරීම හැර වෙනත් ඉදිකිරීම් කටයුත්තක් ආරම්භ කර නොතිබුණු අතර යෝජිත ඉඩම වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පවරා ගැනීමටත්, පාරිසරික යෝග්‍යතාවය පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියෙන් නිර්දේශ ලබාගැනීමටත් කටයුතු කර නොතිබුණි. | මොනරාගල දිසා වන නිලධාරි කාර්යාලය විසින් ඉඩම පවරා දීමට අවශ්‍ය නිර්දේශ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඉදිරි කටයුතු සිදු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී ඇත. | පූර්ව අධ්‍යයනයක් සිදු නොකිරීම හා ව්‍යාජ බිල් පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විනය පියවර ගැනීමටත් කර්මාන්තය කඩිනමින් නිම කිරීමටත් කටයුතු කළ යුතුය . |

1.5.13 ශීර්ෂය 738 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය

(අ) අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 අගෝස්තු 31 දිනැති අංක 21/1596/304/134 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | රජයට මුහුණදීමට සිදුවී ඇති මූල්‍ය දුෂ්කරතාවය සැලකිල්ලට ගෙන ප්‍රතිපාදන වෙන්වී තිබුණ ද දැනට ආරම්භ කර නොමැති වැඩසටහන්, මිලදී ගැනීම්, ඉදිකිරීම්, ගොඩනැගිලි නවීකරණය හා වැඩිදියුණු කිරීම් ආදිය තාවකාලිකව අත්හිටුවීමට ක්‍රියාකරන ලෙසත් ගිවිසුම්ගතවී නොමැති නම් ගිවිසුම් වලට එළඹීම හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමෙන් වැලිකී සිටින ලෙසත් දන්වමින් වියදම් දැඩි ලෙස සීමා කිරීමටත් උපදෙස් දී තිබුණි. ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය ගැනීමෙන් පසු එවැනි කටයුතු සඳහා රු. 1,158,783,869 ක් වැය කර තිබුණි. | පළාතේ අත්‍යාවශ්‍ය සේවාවන් පවත්වා ගැනීම, මානව සම්පත් ප්‍රයෝජනයට ගැනීම වැනි අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීම පළාත් බලධාරීන්ගේ වගකීමක් වන හෙයින් ඒ අනුව කටයුතු කර ඇත. | 2021 අගෝස්තු 31 දිනැති අංක 21/1596/304/134 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව කටයුතු කළ යුතුය. |

(ආ) අභ්‍යන්තර පාලන දුර්වලතා

| | | |
|---|---|---|
| ඌව පළාත් සභාවට අයත් ආයතන 06 ක් විසින් 2021 දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩ ලැබී නොතිබියදී ගෙවීම් වවුචර්පත් 43 ක් මගින් එකතුව රු. 105,507,626 ක් වූ චෙක්පත් සැපයුම්කරුවන් වෙත නිකුත් කර තිබුණි. ඉහත වවුචර්පත් අතරින් එකතුව රු. 27,735,048 ක් වූ වවුචර්පත් 07 ක් සඳහා භාණ්ඩ ලැබුණු බවට ව්‍යාජ සටහන් යොදා තිබුණි. | මෙම තත්ත්වයන් ඇති නොවීමට කල් ඇතිව සැලසුම් කිරීමේ අවශ්‍යතාවය නිළධාරීන්ට පෙන්වා දෙන ලදී. | ඌව පළාත් සභා මුදල් රීති 139 අනුව කටයුතු කිරීමටත් ව්‍යාජ සටහන් යෙදූ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### (අ) මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඌව පළාත් සභා අරමුදලේ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 2,205,982,794 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,868,759,546 ක් විය.

### (ආ) ආදායම් හා වියදම් විචලනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

**ආදායම**

| | 2021 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පළාත් සභා විෂයයන්ට අදාළ ආදායම්** | | | | | | |
| බදු ආදායම | 1,768,220,000 | 1,513,326,027 | (254,893,973) | 1,708,220,000 | 1,531,152,211 | (177,067,789) |
| බදු නොවන ආදායම | 571,780,000 | 612,779,708 | 40,999,708 | 579,780,000 | 500,893,829 | (78,886,171) |
| රජයේ ප්‍රදාන | 28,343,106,749 | 28,343,106,749 | - | 25,476,441,742 | 25,476,441,742 | - |
| එකතුව | 30,683,106,749 | 30,469,212,484 | (213,894,265) | 27,764,441,742 | 27,508,487,782 | (255,953,960) |

**වියදම**

| | 2021 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 22,686,147,768 | 21,985,850,940 | 700,296,828 | 19,254,178,223 | 20,843,181,286 | (1,589,003,063) |
| අනෙකුත් පුනරාවර්තන | 5,489,705,855 | 4,765,456,763 | 724,249,092 | 4,480,933,777 | 4,166,992,029 | 313,941,748 |
| උප එකතුව | 28,175,853,623 | 26,751,307,703 | 1,424,545,920 | 23,735,112,000 | 25,010,173,315 | (1,275,061,315) |
| රාජ්‍ය ආයෝජන | 4,058,000,000 | 3,819,487,572 | 238,512,428 | 1,942,498,447 | 674,302,677 | 1,268,195,770 |
| එකතුව | 32,233,853,623 | 30,570,795,275 | 1,663,058,348 | 25,677,610,447 | 25,684,475,992 | (6,865,545) |

වර්ෂයේ මුළු ආදායම රු. 30,469,212,484 ක් වූ අතර ඉන් රු. 28,343,106,749 ක් රජයේ ප්‍රදාන විය. බදු ආදායම රු. 1,513,326,027 ක් හෙවත් මුළු ආදායමෙන් සියයට 5 ක් ද බදු නොවන ආදායම රු. 612,779,708 ක් හෙවත් මුළු ආදායමෙන් සියයට 2 ක් ද වී තිබුණි. වර්ෂයේ මුළු ආදායම වූ රු. 30,469,212,484 න් පුනරාවර්තන වියදම් සඳහා රු. 26,751,307,703 ක් හෙවත් සියයට 88 ක් ද රජයේ ආයෝජන සඳහා රු. 3,819,487,572 ක් හෙවත් සියයට 12 ක් ද උපයෝජනය කර තිබුණි.

(ඇ) කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් කර වසර 02 ඉක්ම වූ ආයතන 31 කට අදාළ තැන්පතු ශේෂවල එකතුව රු. 50,050,722 ක් මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571 ප්‍රකාරව නියාදනය කර නොතිබුණි. | මු.රෙ. 571 ප්‍රකාරව නියාදන කටයුතු කරන ලෙස ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් ඇස්තමේන්තු අගය රු. මිලියන 4,085 ක ව්‍යාපෘති යෝජනා 2257 ක් අනුමත කර තිබුණි. එම ව්‍යාපෘති යෝජනාවල ප්‍රගතිය පහත දැක්වේ.

| ව්‍යාපෘති විස්තර | නව වැඩ යෝජනා ගණන | අවිච්ඡේද වැඩ යෝජනා ගණන | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
| --- | --- | --- | --- | --- |
| | | | | රු. මිලියන |
| සම්පූර්ණයෙන් නිමකළ | 1905 | 33 | 1938 | |
| සියයට 50 ට වඩා වැඩියෙන් නිමකළ | 160 | 29 | 189 | |
| සියයට 50 ට වඩා අඩුවෙන් නිමකළ | 98 | 15 | 113 | 4,085 |
| ආරම්භකර නොතිබූ | 8 | 0 | 8 | |
| මතභේදකාරී/ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ | 9 | 0 | 9 | |
| එකතුව | 2180 | 77 | 2257 | |